ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF MASS MEDIA



# 2018
# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

සැලසිනෙ
செலசினே
SELACINE
SELACINE TELEVISION INSTITUTE

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2018**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

එස්.ඩී.එන්.ආර්. සුබසිංහ
සභාපති (වැඩ බලන)
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07






# පෙළ ගැස්ම


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර, අරමුණු | 05 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 07 |
| ආයතනික තොරතුරු | 08 |
| පරිපාලන ව්‍යුහය 2018 හා සම්බන්ධ තොරතුරු | 09 |
| මූල්‍ය වාර්තා - 2018 | 15 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 18 |
| ආදායම් ප්‍රකාශය | 20 |
| ශේෂ පත්‍රය | 21 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 22 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 24 |
| 2018 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය | 34 |






# දැක්ම, මෙහෙවර සහ අරමුණු


## මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්‍ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින්

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

## දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම




## අරමුණු

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



# සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වනු ලබන 2018 වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන සතුටුවෙමි.

පසුගිය වසර 37ක ගත වූ කාල පරිච්ඡේදය දෙස හැරී බැලීමේ දී, පැහැදිලිව දැකගත හැකි දෙයක් වනුයේ විවිධ හැල හැප්පිලි තුලින් ආයතනය පෙරට පැමිණීමේ කථාපුවත බව සඳහන් කරමි.

2017 වර්ෂයේ රු.මි.637.3ක අගයක් වූ පිරිවැටුම 2018 වර්ෂයේ දී රු.මි.597.8 දක්වා අඩු වුවද, 2017 වර්ෂයට වඩා රු.මි.11.0ක දල ලාභයක් 2018 වර්ෂයේ දී අත්පත් කර ගැනීමට හැකිවිය. 2018 වර්ෂයේ ශුද්ධ ලාභය රු.මි.29.7 ක් වූ අතර, එය 2017 වර්ෂයේ දී, රු.මි.1.2ක් විය. මේ අනුව 2018 වර්ෂයේ දී 2017 වර්ෂයට වඩා රු.මි.28.5ක ශුද්ධ ලාභයක් අත්පත් කර ගැනීමට ආයතනය සමත් වීම අගය කල යුතු කාර්යයකි.

2018 වර්ෂයේ වෙනත් ආදායම් වර්ධනයක් පෙන්නුම් කල අතර, ආයතන හා පරිපාලන වියදම් රු.මි.3.7කින් 2018 වර්ෂයේ දී 2017 වර්ෂයට වඩා අඩු වූ අතර, අලෙවි හා බෙදා හැරීමේ වියදම් රු.මි.4.4කින් 2018 වර්ෂයේ දී, 2017ට සාපේක්ෂව අඩුකර ගත හැකිවීම කැපී පෙනෙන ජයග්‍රහණයන්ය.

ආයතනයේ මානව සම්පත් සංවර්ධනය වේගවත්ව සිදු වූ අතර, සේවකයන් සඳහා වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම, ක්‍රීඩා තරඟ, විනෝද ගමන් වැනි අභිප්‍රේරණ කටයුතු හා සේවකයාට පුහුණු අවස්ථා ලබා දීමටද කටයුතු කිරීමට හැකිවීම මෙම ජයග්‍රහණ වලට හේතුවිය.

ගිණුම් අංශය විසින් මූල්‍ය වාර්තා සැකසීමේ දී, නව තාක්ෂණය යොදා ගනිමින් ඉටුකර ගැනීමටත් කටයුතු කරනු ලැබේ. ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ කටයුතු නියමිත දිනවලට සිදු කිරීමට ප්‍රයත්න දරනු ලැබේ.

ලේක්හවුස් ආයතනය සමග දැන්වීම් පලකිරීමේදී, වඩාත් වාසිදායක තත්වයක් උදාකර ගැනීමට හැකි වූ අතර, එම ආයතනයට දැන්වීම් ලබාදෙන ආයතන අතර, ප්‍රථම ස්ථානය අත්පත්කර ගැනීමට සමත්වීම ඇගයිය යුතුය. ඒ සඳහා ග්‍රැෆික් අංශය විසින් සුදුසු නිර්මාණාත්මක දැන්වීම් සිදු කිරීම හා මාධ්‍ය අංශය විසින් දැන්වීම් උපලේඛනගත කිරීමේ දී වැඩි දායකත්වයක් දරණ ලදි.

අලෙවි අංශය විසින් නියමිත අලෙවි ඉලක්කයක් සඳහා ලඟා වීමට අවශ්‍ය කැප කිරීම් සිදු කරන ලදි.මේ සඳහා ආයතනයේ ඉසව් කටයුතු අංශයෙන්ද යහපත් ප්‍රතිචාර ලැබී ඇත. එම අංශවල ඒකාබද්ධතාවය තුල මෙම ජයග්‍රහණය ලබාගැනීමට පිටුවහලක්ව ඇත.

නිෂ්පාදන අංශය විසින් ආයතනයේ ප්‍රතිරූපය ඉහල නංවාලීමට දායකවන නිෂ්පාදන කටයුතු රාශියක් ඉටුකරන ලදි. සංචාරක ආර්ෂණයකින් යුත් මෙම නිෂ්පාදන වැඩි දෙනෙකුගේ අවධානයට ලක්විය.

ආයතනයට අළුතින් එක්වූ වෙබ් සංවර්ධන අංශය මගින් ආයතනය පිළිබඳව බාහිර පාර්ශ්වයන් දැනුවත් කිරීම හා සම්බන්ධතා පැවැත් වීමට දායක වේ.

පසුගිය කාල සීමාවේ ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් වලට සාපේක්ෂව ඒවා අවබෝධකර ගනිමින්, යථානුරූපීව නියමිත ඉලක්කයන් ඔස්සේ ආයතනය නිවැරදි දිශාවකට ගෙනයාමේ අභියෝගය සඳහා සියළු දෙනාට එක්වී ජයගනු ඇත යන්න සැමගේ පැතුම වේ.



එස්.ඒ.එන්.ආර්. සුබසිංහ
සභාපති (වැඩ බලන)
සැලසිනෙ රූපවාහිනී ආයතනය

# ආයතනික තොරතුරු

### නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

### නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවිදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

### ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
    - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
    - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
    - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.






# පරිපාලන ව්‍යුහය - 2018

### ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| ජේ.එම්.එන්.එස්. ජයවර්ධන | - | සභාපති (2018.01.21 - 2018.05.04) |
| උමා රාජමන්ත්‍රී | - | සභාපතිනිය (2018.05.17 - 2018.10.26) |
| ජේ.එම්.එන්.එස්. ජයවර්ධන | - | සභාපති (2018.11.11 - 2018.12.30) |
| මංජුල හේරත් | - | සාමාන්‍යාධිකාරී |

### කළමනාකරණය

| | | |
|---|---|---|
| ඊ.එම්.ඒ.ආර්. ඒකනායක | - | කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) (2018.01.01 - 2018.10.17) |
| එච්.එම්.යූ.සී.පී. හේරත් | - | කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) (2018.10.15 - 2018.12.31) |
| සුනන්ද වීරසිංහ | - | කළමනාකරු (නිෂ්පාදන) |
| අග්බෝ අමරසේකර | - | පාරිභෝගික සේවා අධ්‍යක්ෂ |
| නලීන් අලහකෝන් | - | කළමනාකරු (මාධ්‍ය) |
| ශාන්ත ලොකුකැටගොඩ | - | කළමනාකරු (මූල්‍ය) |
| සුජිත් පුෂ්පකුමාර | - | කළමනාකරු (ග්‍රැෆික්) |
| අයි.එල්.පී. ප්‍රනාන්දු | - | කළමනාකරු (අධිවේගී මුද්‍රණ) |
| ඉන්දික විජේතුංග | - | කළමනාකරු (මිලදී ගැනීම් හා සැපයීම්) |

### විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

### බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

### සම්බන්ධීකරණ තොරතුරු

| | | |
|---|---|---|
| **ලිපිනය** | - | අංක. 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 |
| **දුරකථනය** | - | 011-4320777, 011-4061586 |
| **ෆැක්ස්** | - | 011-2058229 |
| **විද්‍යුත් තැපෑල** | - | selacine@gmail.com |
| **වෙබ් අඩවිය** | - | www.selacine.lk |




# නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

සැලසිනෙ ආයතනයේ කාර්යශූර හා නිර්මාණශීලී තවත් අංශයක් ලෙස නිර්මාණ හා ග්‍රැෆික් අංශය හඳුන්වාදිය හැකිය. මෙම අංශයෙහි පළපුරුදු වෘත්තීය ග්‍රැෆික් නිර්මාණ ශිල්පීන් ඕනෑම නිර්මාණශීලී කටයුත්තක් සඳහා නිරතුරු සූදානමින් සිටියි. ඔවුන් පැය අටක කාල රාමුවක් තුළට කොටු නොවී ග්‍රැෆික් නිර්මාණකරණයේ නව තාක්ෂණික දැනුමෙන් නිරන්තර යාවත්කාලීන වෙමින් තමන් හට පැවරුණු කාර්යයන් නිසි වගකීමෙන් යුතුව කැපවී ඉටු කරයි.

පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවීකරණය මෙන්ම පෝස්ටර් සහ බැනර් ආදී ප්‍රකාශනයන් නිර්මාණය කිරීමෙහිලා මූලික කේන්ද්‍රස්ථානය වනුයේද මෙම අංශයයි. වේලාව අවේලාව තැකීමකින් තොරව තම කාර්යභාරය ඉටු කරනු ලබන අප අංශය, නිර්මාණශීලීත්වය හා කලට වේලාවට වැඩ නිම කර දීම මෙන්ම අප සේවාදායකයන් සමඟ වෘත්තීය වශයෙන් පවත්වාගෙන යනු ලබන සුහදශීලී මහජන සම්බන්ධතාවයන් හේතුවෙන් එම සේවාදායකයන්ට අපගේ දීර්ඝකාලීන සේවාවන් සැපයීමත් අප හට පාරිභෝගිකයින්ගෙන් හිමි වන නොමද ප්‍රශංසා ආදියට හේතු වෙයි.

ලේක් හවුස් ආයතනය වෙත ලැබෙන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙනුයේ අපගේ සැලසිනෙ ආයතනයයි. එම දැන්වීම් නිර්මාණය කිරීමේ භාරදූර වගකීම සෘජුවම නිර්මාණ හා ග්‍රැෆික් අංශය වෙත පැවරෙයි. එම වගකීම නොපිරිහෙලා ඉටුකරමින් උසස් තාක්ෂණික දැනුම භාවිතයෙන් ගුණාත්මකව මෙන්ම නිරවද්‍යතාවයෙන් යුතුව නිර්මාණය වන දැන්වීම් ගොන්න ආයතනයේ කීර්ති නාමය වෙතටද ගෙන එන්නේ ආලෝකයකි.

වසර ගණනාවක් පුරා මෙලෙස සිදුවන ක්‍රියාවලිය තුළ අන් වසර වල මෙන්ම 2018 වසරේදී ද ගුණාත්මකබව සහ කාර්යක්ෂමතාව දිනෙන් දින වැඩි කරගනිමින් සැලසිනේ නිර්මාණ හා ග්‍රැෆික් අංශය ඉදිරියටම පියනගමින් සිටියි.

# මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් මාධ්‍යයන්හි, දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම්ය. එය සෑම වර්ෂයකම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුළිනි. ඒ අනුව 2018 වර්ෂයේ දී වඩාත් කාර්යක්ෂමව සිදු කරන ලදි. මෙහිදී සමස්ත ආයෝජනය රු.මිලියන 435,925,412.29 කි.

2018 වර්ෂයේ ද ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබා දෙන ලදි. ඒ අනුව අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලබාදෙන ලදි.

තවද රූපවාහිනී හා ගුවන්විදුලි උපලේඛනගත කිරීම් සඳහා අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලැබෙන අතර, මීට අමතරව සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවි තුලද අපගේ මාධය උපලේඛනගත කිරීම් සිදු කෙරේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරන නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහල මට්ටමේ හැකියාවන් සැලසිනෙ ආයතනය සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.






## අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2018 අවසන් වූ මුදල් වර්ෂ සඳහා රු.මි.597.8 මුදලක් අලෙවි අංශය මගින් උපයා ඇත. මෙම 2017 වර්ෂය හා සසඳා බැලීමේ දී යම් පසු බෑමකට ලක්ව ඇති බව පිළිගත යුතු අතර, එයට ප්‍රධානම හේතු කාරනය වූයේ රටෙහි පැවැති අස්ථාවර දේශපාලනික තත්වයයි.

මෙවන් තත්වයක වුවද ආයතනයෙහි සියළු අංශයන්හි සහය ලබා අලෙවි අංශය ලබා ඇති ප්‍රගතිය පිළිබඳව සතුටු විය හැක.

## මානව සම්පත් හා පරිපාලන අංශය

අපගේ ඉහලම සම්පත හා වත්කම වන්නේ ආයතනයේ මානව සම්පතයි. ආයතනයේ ඉදිරි දැක්මේ ඉලක්කයන් සපුරා ගැනීමට යන ගමනේ මානව සම්පත තුලින් උපරිම දායකත්වය ලබා ගැනීමට පරිපාලන අංශය වෙතින් 2018 වර්ෂය සඳහා සිදුකරන ලද මෙහෙවර මෙසේය.

- වසර 36 ක දිගුකාලින ඉතිහාසයකට උරුමකම් කියන සැලසිනෙ ආයතනය නීතිගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර අවසන් අදියරේ පවතියි. ඊට අමතරව ආයතනික ව්‍යුහය නව ප්‍රචාරක ආයතන හා තරගකාරිත්වයට මුහුණ දීමේ අභියෝගය කෙරෙහි සැලකිලිමත් වී සකස්කිරීම හා බඳවා ගැනීමේ ක්‍රමවේදයන් විධිමත්ව සිදුකිරීමට ද කටයුතු කර ඇත.

- අඛණ්ඩ පුහුණු වැඩ සටහන් සහ උද්යෝගය වැඩි දියුණු වන ආකාරයේ පරිසරයක් ගොඩනැගීම තුලින් ආයතනික කාර්ය මණ්ඩලයේ උද්යෝගිමත් බව වැඩි දියුණු කිරීම. ඔවුන් සතු උපරිම හැකියාවන් පිළිබඳ ඔවුන්ට හැඟීමක් සහ විශ්වාසයක් ඇති කරවීම සහ ආයතනික කාර්යයන් වෙත ඔවුන්ගේ උපරිම දායකත්වය ලබා ගැනීම තුලින් ඵලදායිතාවය වැඩි දියුණු කර ගැනීම.

- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුභසාධනය වෙනුවෙන් ඉහල ප්‍රතිලාභ වලින් යුත් සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමවේදයක් ලබාදිම සේවක ණය ලබාදීම, උත්සව අත්තිකාරම්, ප්‍රසාද දීමනා ලබාදීම තුලින් සේවකයින්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම.

- ආයතනයේ කාර්යක්‍ෂමතාවය හා ඉහල සේවාවන් ලබාදීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය කාර්යාලීය උපකරණ හා ලිපිද්‍රව්‍යයන් කඩනමින් ලබාදීමට ද කටයුතු කර ඇත.




## නිෂ්පාදන අංශය

සැලසිනේ ආයතනයේ ආම්භයේ සිටම පැවතෙන ශ්‍රව්‍ය දෘෂ්‍ය නිෂ්පාදන අංශය ආරම්භයේ සිටම නිර්මාණාත්මක හරවත් නැනවත් නිර්මාණ රැසක් බිහි කිරීමට හැකිවීම ආඩම්බරයට කරුණකි.

2018 වසරේ දී ඌව පළාත් සභාවට සිදු කරන ලද වාර්තා වැඩසටහන් මාලාව, සෞඛ්‍ය අමාත්‍යංශයට නිර්මාණය කල වාර්තා වැඩසටහන් මාලාව, වයඹ පළාත් සභාව වෙනුවෙන් නිර්මාණය කල වාර්තා වැඩසටහන් මාලාව සහ කොළඹ කටුනායක අධිවේගී මාර්ගය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, ලංකා සතොස ආයතනය වැනි ආයතන සඳහා නිර්මාණය කරන ලද වෙළඳ දැන්වීම් ආදිය සිදු කරන ලද ප්‍රමුඛ නිර්මාණයන්ය.

2017 වසරේ මුල් කාර්තුවේ 0ග09 සැලසිනේ මුළු ආදායමෙන් නිෂ්පාදන අංශය දැක් වූ දායකත්වය 2018 වසර අවසන් කාර්තුව වන විට 11 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වූ අතර සැලසිනේ ආයතනයේ වැඩිම ලාභ ප්‍රතිශතයක් ලබන අංශය බවට නිෂ්පාදන පත්වීම අපට ආඩම්භරයකි.

## මූල්‍ය අංශය

ගිණුම් කටයුතු යථා තත්වයට ගෙන ඒමට වැඩි වෙහෙසක් දැරීමට පසුගිය කාල සීමාවේ දී කැප කිරීමකින් කටයුතු කරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස විගණන විමසුම් අඩුකර ගැනීමට හැකිවීම, පැරණි වර්ෂවල ගිණුම් වාර්තා සියල්ල පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම පැසසුම් කල යුතුය.

ගිණුම් වාර්තා සැකසීම, තොරතුරු අමාත්‍යංශය හා විගණනය වෙත කඩිනමින් ලබා දීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශ්වයන් වෙත කඩිනමින් ලබා දීමට පියවර ගනු ලැබේ.

විගණකාධිපතිගේ මතය 2011, 2012, 2015, 2016 හා 2017 යන වර්ෂවලදී රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බවට විගණකාධිපති මතයක් පලකිරීම අඛණ්ඩව රැක ගැනීමට ගිණුම් අංශය කටයුතු කර ඇත.මෙම තත්වය රැක ගනිමින් ඊට වඩා ඉහළ මතයක් ලබා ගැනීමට ගිණුම් අංශය විසින් සැලසුම් සකස්කර ඇත.






# ඉසව් කළමනාකරණ අංශය


2015 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයට අලුතින් එක් වූ අංශයක් ලෙස ඉසව් අංශය හැඳින්විය හැක. රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි දැවැන්ත ඉසව් කළමනාකරණය කිරීම මෙම අංශය මගින් සිදුවේ. 2018 වර්ෂයේ දී අප ආයතනය සිදුකල ඉසව් අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ “ටුක් ටුක්” ඉසව් වැඩසටහන රුපියල මිලියන 2ක මූල්‍යමය වටිනාකමකින් යුක්ත වූවා, එමෙන්ම ජනමාධ්‍ය අමාත්‍යංශය මගින් පවත්වනු ලබන ජනමාධ්‍ය සම්මාන - 2018 උළෙල රුපියල් මිලියන 8ක පමණ මූල්‍ය වටිනාකමකින් යුක්ත වූවා, එමෙන්ම, “රාජකීය විද්‍යාලය” සංවිධානය කල එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ මුදල් අමාත්‍යංශ ප්‍රදර්ශන කුටිය රුපියල් මිලියන 4ක පමණ මූල්‍යමය වටිනාකමින් යුක්තය. එමෙන්ම මුදල් අමාත්‍යංශය මෙහෙයවන “සංහිදියාව” පිළිබඳ වැඩසටහන් මාලාවේ “අහන්න” වැඩසහන් 3ක් විවිධ ප්‍රදේශවල සිදුකල අතර, එහි මූල්‍ය වටිනාකම රුපියල් මිලියන 14කින් යුක්ත ඉසව් වලට අමතරව “ලංකා විදුලිබල මණ්ඩලය” මගින් සංවිධානය කල විවධ ඉසව්වල වටිනාකම රුපියල් මිලියන 6ක් පමණ වේ.

2017 වර්ෂයට සාපේක්ෂව මෙම වසරේ ඉසව් අංශයේ වඩි දියුණු වීමක් පෙන්නුම් කරන අතර, 2019 වර්ෂය වන විට නව තාක්ෂනික ක්‍රමවේද භාවිතා කරමින්, නව ඉසව් කළමනාකරණ ක්‍රමවේදයන් අප හදුන්වා දීමට නියමිත අතර, අපේක්ෂිත ආදායම තවත් ඉහළ නැංවීමට සූදානම්ය...


# මූල්‍ය වාර්තාව 2018




## ආදායම් වර්ධනය





## පසුගිය වසර පහ තුළ දළ ලාභයේ ප්‍රවණතාවය



## 2014 - 2018 වසර අතර ආයතනික ලාභයේ උපනතිය

**පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදම් වල උපනතිය**



# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති**

**1. පොදු කරුණු**

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2019.02.26 වෙනි දිනැති අංක 2112/13 දරන විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රමාණය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමණාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

1.3 සේවක ප්‍රමාණය

2018.12.31 වන දිනට 64 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

**2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සාරාංශය**

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙම ණය පිරිවැය හදුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

**3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම**

3.1 දේපල පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළඳ සහ ලැබිය යුතු දෑ

වෙළඳ සහ ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

එක් එක් අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත පරිදි වන අතර එහි පවත්නා ඇස්තමේන්තු ඵලදායී කාලය සහ සාපේක්ෂ කාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 10 |
| පරිගණක උපකරණ | වර්ෂ 05 |
| කාර්යාලීය උපකරණ | වර්ෂ 10 |
| මෝටර් වාහන | වර්ෂ 05 |
| කැමරා සහ චිත්‍රපට උපකරණ | වර්ෂ 10 |
| පරිගණක මෘදුකාංග | වර්ෂ 10 |

**4. වගකීම් සහ ප්‍රතිපාදන**

4.1 වගකීම් වර්ගීකරණය වන්නේ ඉල්ලුම මත ගෙවීමට බැඳී සිටින පවත්නා ශේෂ පත්‍රයේ වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ය. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් ලෙස අයිතම වර්ගීකරණය වී ඇත.

4.2 විශ්‍රාම සහ ප්‍රතිලාභ දීමනා

සේවක ප්‍රතිලාභ - LKAS 19 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන ප්‍රතිලාභ දීමනා පනතට අනුකූලව ඒ යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාව සහ රෙගුලාසිවලට සමගාමීව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබනු අතර ආයතනය විසින් 15% ක සහ 3% ක් සේවකයින්ගේ මුළු වේතන ප්‍රමාණයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වේ.

**5 ආදායම් ප්‍රකාශය**

5.1 පිරිවැටුම

සැලසිනෙ පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමණාකරණ, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සසම්භාවී ලෙස ගලා ඒමේ ප්‍රමාණය සහ ආදායම් විශ්වාසී ලෙස ගණනය කිරීම ආදායම් හඳුනා ගැනීම ලෙස හැඳින්වේ.

5.3 වියදම් හඳුනා ගැනීම

වියදම් හදුනා ගැනීම ආදායම් ප්‍රකාශනයේ සෘජු සම්බන්ධතාවය අතර පිරිවැය සහ විශේෂී අයිතම සඳහා වූ ආදායම් ඉපැයුම් පදනම මත වියදම් හදුනා ගැනීම සිදු කරනු ලැබේ.

**6. අදාළ පාර්ශව අතර ගනුදෙනු**

LKAS 24 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

**7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාළ පසු ගැලපුම් සටහන්**

මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැලපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

**8. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු.300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.**

**9. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ. 2006 වසරේ හඳුනානොගත් ණය ගැතියන් සඳහා අඩමාන ණය සම්පූර්ණයෙන්ම වෙන්කොට ඇත.**

**10. 10.1 සේවකයන් දෙදෙනෙකුට විරුද්ධව ආයතනය විසින් නීතිමය පියවර ගෙන ඇත.**

**10.2 මෙහි සඳහන් විගණන විමසුම් වලට අනුව ආයතනයේ වත්කම් නැවත ප්‍රති අගය 2019 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**




# ආදායම් ප්‍රකාශය

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2018 රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|---|
| ආදායම් | **11** | **597,861,538.10** | **637,351,163.32** | **397,692,282.97** |
| සෘජු පිරිවැය | **12** | 490,793,242.38 | 541,297,909.69 | 342,085,817.84 |
| **දළ ලාභය / අලාභය** | | **107,068,295.72** | **96,053,253.63** | **55,606,465.13** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **13** | 13,822,647.07 | 4,379,747.31 | 4,783,264.44 |
| | | **120,890,942.80** | **100,433,000.94** | **60,389,729.57** |
| පරිපාලන හා ආයතන වියදම් | **14** | (67,378,237.30) | (71,096,270.58) | (62,608,575.31) |
| ආලවිකරණ හා බෙදාහැරීමේ වියදම් | **15** | (21,892,667.18) | (26,231,866.42) | (17,086,815.43) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය** | | **31,620,038.31** | **3,104,863.94** | **(19,305,661.17)** |
| මූල්‍ය වියදම් | **16** | (224,807.66) | (124,084.60) | (180,985.45) |
| වෙනත් වියදම් | **17** | (1,690,794.00) | (1,770,342.59) | (6,142,345.59) |
| **බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය/අලාභය** | | **29,704,436.65** | **1,210,436.75** | **(25,628,992.21)** |
| **බදු හර කල පසු ලාභය/අලාභය** | | **29,704,436.65** | **1,210,436.75** | **(25,628,992.21)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය/අනෙකුත් විස්තිරණ ආදායම් | | - | - | - |
| **වර්ෂය සඳහා මුළු මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය/අලාභය** | | **29,704,436.65** | **1,210,436.75** | **(25,628,992.21)** |






# ශේෂ පත්‍රය


**2018 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2018 රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන** | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 18 | 9,703,764.59 | 11,170,153.95 | 12,608,937.31 |
| අස්පෘශ්‍ය වත්කම් | 18-A | 3,559,605.76 | 3,460,377.76 | 3,999,830.83 |
| ගොඩනැගිලි වියදම් | | 1,842,062.05 | 3,684,124.10 | 5,526,186.14 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **15,105,432.40** | **18,314,655.81** | **22,134,954.28** |
| **ජංගම** | | | | |
| ආයෝජන | 19 | 20,898,200.00 | 898,200.00 | 898,200.00 |
| වෙළඳ හා ලැබිය යුතු වත්කම් | 20 | 465,547,234.05 | 390,651,319.86 | 214,490,075.74 |
| තැම්පතු හා පෙරගෙවුම් | 21 | 1,395,510.60 | 1,662,656.66 | 1,944,593.80 |
| මුදල් හා සමාන දෑ | 22 | 13,380,385.01 | 31,416,455.80 | 8,559,416.92 |
| **ජංගම වත්කම්** | | **501,221,329.66** | **424,628,632.32** | **225,892,286.46** |
| **මුළු වත්කම්** | | **516,326,762.06** | **442,943,288.13** | **248,027,240.74** |
| **ස්කන්ධ හා වගකීම්** | | | | |
| **ස්කන්ධය** | | | | |
| රඳවාගත් ලාභය / අලාභය | | 109,791,825.84 | 70,209,475.81 | 57,883,448.68 |
| **මුළු ස්කන්ධය** | | **109,791,825.84** | **70,209,475.81** | **57,883,448.68** |
| **වගකීම්** | | | | |
| **ජංගම නොවන** | | | | |
| උපචිත පාර්තෝෂික දීමනා | 23 | 11,919,393.60 | 9,692,481.86 | 8,639,956.56 |
| කල්බදු ණය පොළී | 24 | - | - | |
| මහාභාණ්ඩාගාර ණය | | - | - | 465,000.00 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **11,919,393.60** | **9,692,481.86** | **9,104,956.56** |
| **ජංගම** | | | | |
| කල්බදු ණය පොළී | 24 | - | - | |
| වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම් | 25 | 394,485,990.62 | 362,911,778.46 | 179,049,283.50 |
| මහාභාණ්ඩාගාර ණය | | - | - | 1,860,000.00 |
| අත්තිකාරම් ලැබීම් | | 129,552.00 | 129,552.00 | 129,552.00 |
| **මුළු ජංගම වගකීම්** | | **394,615,542.62** | **363,041,330.46** | **181,038,835.50** |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **516,326,762.06** | **442,943,288.13** | **248,027,240.74** |

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සමාන්‍යාධිකාරී - සැලසිනෙ රූපවාහිනී ආයතනය

මෙම මූල්‍යමය ප්‍රකාශය සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබන ලදී.



සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය




# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය | 29,704,436.65 | 1,210,436.75 |
| **ගැලපීම්;** | | |
| බදු පොලී | - | |
| පොලී ආදායම් | (536,796.08) | (99,309.82) |
| දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම් | 3,170,873.00 | 4,001,678.11 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2,797,621.74 | 1,052,525.30 |
| දේපල අපහරණය කිරීමෙන් ලද ලාභය / අලාභය | - | 61,369.34 |
| පසුගිය වර්ෂයට අදාළ ගැලපීම් | 9,877,913.38 | 11,115,590.38 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **45,014,048.69** | **17,342,290.06** |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්) | (73,122,256.14) | (177,126,051.07) |
| තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්) | 267,146.06 | 281,937.14 |
| වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්) | 31,574,212.16 | 183,862,494.96 |
| ලද අත්තිකාරම් (වැඩිවීම් / අඩුවීම්) | - | - |
| ගොඩනැගිලි වියදම් සඳහා ප්‍රතිපාදන (වැඩිවීම් / අඩුවීම්) | - | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **3,733,150.77** | **24,360,671.09** |
| පාරිතෝෂික ගෙවීම් | (570,710.00) | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **3,162,440.77** | **24,360,671.09** |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්** | | |
| දේපල පිරිවිත, යන්ත්‍රාගාර හා උපකරණ මිලදී ගැනීම් | (1,735,307.64) | (1,602,942.02) |
| පොලී ආදායම් | 536,796.08 | 99,309.82 |
| ස්ථාවර තැම්පතු | (20,000,000.00) | - |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **(21,198,511.56)** | **(1,503,632.20** |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම් / ආපසු ගෙවීම් | - | - |
| ණය ආපසු ගෙවීම් | - | - |
| බදු ගෙවීම් නිවැරදි කිරීම් | - | - |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | **-** | **-** |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | **(18,036,070.79)** | **22,857,038.89** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A) | 31,416,455.80 | 8,559,416.91 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)** | **13,380,385.01** | **31,416,455.80** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **සටහන A** | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299 | 7,540,695.27 | 29,724,501.94 |
| ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765 | 315,207.27 | 291,145.04 |
| මහජන බැංකුව 200100130005980 | 3,467,878.97 | 791,574.32 |
| නිශ්පාදන අත්තිකාරම් | 1,881,603.50 | 424,234.50 |
| අනෙකුත් අත්තිකාරම් | 175,000.00 | 185,000.00 |
| | **13,380,385.01** | **31,416,455.80** |

# ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018 රු. |
|---|---|
| | **රදවාගත් ලාභය** |
| 2018 ජනවාරි 1 දිනට ශේෂය | 70,209,475.81 |
| පෙර වර්ෂයට අදාල ගැලපීම් (සටහන 28) | 9,877,913.38 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය | 29,704,436.65 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **109,791,825.84** |




# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **සටහන - 11 - ආදායම්** | | | |
| නිශ්පාදන | 64,274,782.71 | 32,661,878.25 | 19,865,749.83 |
| ග්‍රැපික් | 44,104,237.11 | 48,299,073.00 | 13,492,843.62 |
| උපලේඛනගත කිරීම් | 435,925,412.29 | 405,675,446.93 | 314,834,334.00 |
| ඉසව් | 52,042,205.99 | 150,487,265.14 | 48,150,355.52 |
| වෙනත් | 7,500.00 | 82,500.00 | 84,000.00 |
| වෙබ් | 1,507,400.00 | 145,000.00 | 1,265,000.00 |
| | **597,861,538.10** | **637,351,163.32** | **397,692,282.97** |
| **සටහන - 12 - සෘජු පිරිවැය** | | | |
| නිශ්පාදන වියදම් | 43,229,765.58 | 28,656,917.64 | 17,141,833.00 |
| ග්‍රැපික් වියදම් | 40,018,353.15 | 33,511,635.16 | 13,965,362.04 |
| උපලේඛනගත වියදම් | 358,077,255.35 | 347,405,543.49 | 272,997,261.84 |
| ඉසව් කළමනාකරණ වියදම් | 48,115,268.30 | 131,586,313.40 | 36,804,690.96 |
| වෙබ් අඩවි වියදම් | 1,352,600.00 | 137,500.00 | 1,176,670.00 |
| වෙනත් වියදම් | - | - | - |
| | **490,793,242.38** | **541,297,909.69** | **342,085,817.84** |
| **සටහන - 13 - වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| විශේෂ කොමිස් ලැබීම් | 12,097,784.00 | - | - |
| සේවක ණය පොළී | 136,066.99 | 116,790.59 | 107,321.49 |
| බැංකු පොළී | 536,796.08 | 99,309.82 | 145,449.20 |
| වත්කම් විකිණීමේ (ලාභය/අලාභය) | - | - | - |
| වෙනත් ආදායම් | 243,000.00 | 3,531,849.90 | 4,425,393.75 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 632,000.00 | 312,000.00 | 9,500.00 |
| පරිවර්තන ගාස්තු | 75,000.00 | - | 80,000.00 |
| නිර්මාණ ගාස්තු | 65,000.00 | 281,000.00 | - |
| ප්‍රවාහන ගාස්තු | 37,000.00 | 38,797.00 | 15,600.00 |
| | **13,822,647.07** | **4,379,747.31** | **4,783,264.44** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018 රු. | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **සටහන - 14 - පරිපාලන හා ආයතන වියදම්** | | | |
| දීමනා | 16,400.00 | - | |
| දීමනා - සභාපති | 1,447,555.64 | 1,547,928.00 | 1,500,000.00 |
| දීමනා - කොන්ත්‍රාත් | 673,180.88 | 945,924.66 | 712,150.00 |
| දීමනා - පුහුණු | 120,250.00 | 176,250.00 | 652,133.36 |
| දීමනා - ප්‍රවාහන | 800,000.00 | 900,000.00 | 560,000.00 |
| දීමනා - ඉන්ධන | 329,110.32 | 290,065.26 | 448,100.32 |
| දීමනා - දුරකතන | 150,548.39 | 156,000.00 | 156,000.00 |
| විගණන ගාස්තු | 250,000.00 | 120,000.00 | 110,000.00 |
| අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම් | 13,604.00 | - | |
| දීමනා - අධ්‍යක්ෂක මණ්ඩල | 142,500.00 | 45,000.00 | - |
| ප්‍රසාද දීමනා | 1,293,348.00 | 662,125.00 | 680,500.00 |
| ගොඩනැගිලි වියදම් | 1,842,062.05 | 1,842,062.04 | 1,842,062.04 |
| ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපටි සංස්ථාව | 3,780,000.00 | 3,780,000.00 | 3,780,000.00 |
| ගොඩනැගිලි කුළී වියදම් - රාජගිරිය කාර්යාලය | - | 733,335.84 | 565,390.32 |
| පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම් | 103,298.94 | 80,186.00 | 119,658.00 |
| පරිගණක අලුත් වැඩියා වියදම් | 217,750.00 | 26,480.00 | 118,041.11 |
| උපදේශක ගාස්තු | 17,415.00 | 50,000.00 | - |
| ක්ෂය වීම් | 2,421,396.00 | 2,641,533.37 | 2,230,019.53 |
| අධ්‍යක්ෂක වේතන | 484,408.69 | 505,500.00 | 647,483.33 |
| ආධාර | 207,500.00 | 553,400.00 | 453,199.56 |
| විදුලිය | 705,469.10 | 790,952.95 | 462,481.24 |
| සේවක අර්ථ සාධක අරමුදල | 2,876,767.26 | 2,541,168.90 | 2,436,156.27 |
| සේවක අර්ථ සාධක අරමුදල | 881,740.37 | 507,727.05 | 429,730.96 |
| විදේශ ගමන් වියදම් | - | - | 298,759.80 |
| තෑගි වවුචර් වියදම් | 378,830.00 | 646,847.50 | 288,000.00 |
| පාරිතෝෂික දීමනා | 2,779,683.74 | 1,184,500.55 | 2,534,524.27 |
| අන්තර්ජාල වියදම් | 339,451.57 | 447,271.63 | 203,030.66 |
| කම්කරු වියදම් | 36,000.00 | 39,895.00 | - |
| වෙනත් වියදම් | 1,350.00 | 11,000.00 | - |
| පුවත්පත් මිලට ගැනීමේ වියදම් | 94,625.00 | 118,145.00 | 60,492.00 |
| අලුත් වැඩියා නඩත්තු - කාර්යාලීය උපකරණ | 145,544.52 | 79,135.00 | 81,088.00 |
| අලුත් වැඩියා නඩත්තු - නිශ්පාදන උපකරණ | 625,912.49 | 672,398.47 | 96,466.00 |
| අධිහාර වියදම් | - | 102,564.57 | 6,510.20 |
| තැපැල් ගාස්තු | 14,550.70 | 28,970.00 | 38,141.00 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,621,862.03 | 1,475,598.52 | 1,534,437.69 |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
|---|---:|---:|---:|
| වෘත්තීය ගාස්තු | 30,000.00 | - | - |
| ගිවිසුම් අලුත් කිරීම | - | 12,000.00 | 27,500.00 |
| ලියාපදිංචි ගාස්තු | 103,035.00 | 90,665.00 | 119,000.00 |
| සංග්‍රහ වියදම් | 1,740.00 | - | - |
| වැටුප් හා වේතන | 34,465,547.39 | 37,732,241.83 | 31,958,987.77 |
| ආරක්ෂක සේවා වියදම් | 722,252.00 | 1,073,830.00 | 1,151,172.00 |
| ඉඩකඩ වෙන්කර ගැනීම (තාවකාලික) | 31,000.00 | 3,000.00 | - |
| සේවක රක්ෂණ | 2,259,260.66 | 2,545,397.07 | 1,451,568.31 |
| සේවක අතිකාල සහ යැපීම් දීමනා | 2,369,962.74 | 2,231,596.43 | 1,775,515.02 |
| සේවක සුභසාධනය | 882,590.69 | 868,703.05 | 793,292.59 |
| දුරකතන ගාස්තු | 424,842.41 | 577,366.85 | 515,270.46 |
| ටෙන්ඩර් ගාස්තු | 56,600.00 | 24,500.00 | 32,000.00 |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 31,200.00 | 118,250.00 | 447,865.60 |
| පරිවර්තන ගාස්තු | 437,397.50 | 209,800.00 | 261,500.00 |
| වාහන කුලී | 460,000.00 | 1,605,000.00 | 780,000.00 |
| පානීය ජලය | 285,694.22 | 284,155.04 | 156,927.90 |
| වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම් | 5,000.00 | 17,800.00 | 17,920.00 |
| | **67,378,237.30** | **71,096,270.58** | **62,608,575.31** |

**සටහන - 15 - අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්**

| | | | |
|---|---:|---:|---:|
| නිර්මාණ ගාස්තු | 480,400.00 | 2,001,522.00 | 95,000.00 |
| බොල්ණය | 1,864,995.28 | 2,994,377.69 | (601,208.77) |
| සම්බන්ධීකරණ ගාස්තු | - | 485,510.00 | 170,900.00 |
| නිර්මාණාත්මක නියෝජිත කොමිස් | 279,645.63 | - | |
| මෝටර්රථ වාහන ක්ෂය වීම් | 134,479.00 | 708,191.67 | 1,567,164.80 |
| ඉන්ධන වියදම් | 815,531.18 | 789,748.34 | 837,935.89 |
| මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම් | 689,321.37 | 924,967.40 | 1,111,799.26 |
| මුද්‍රණ වියදම් | 83,250.00 | 68,254.00 | 14,587.00 |
| අලෙවි දිරි දීමනා | 781,255.71 | 1,748,539.59 | 921,832.46 |
| අලෙවි ප්‍රවර්ධන හා දැන්වීම් | 79,160.00 | 526,365.69 | 85,630.00 |
| විශේෂ වට්ටම් | 16,105,880.68 | 15,196,477.91 | 12,467,591.92 |
| විශේෂ ඉසව් කටයුතු වියදම් | - | 444,800.00 | - |
| ණය අයකර ගැනීමේ වියදම් | - | 5,000.00 | - |
| මුද්දර ගාස්තු | 18,950.00 | 16,355.40 | - |
| ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීම් | 160,047.24 | 174,448.82 | 215,143.96 |
| වාහන රක්ෂණ | 399,751.09 | 147,307.91 | 200,438.91 |
| | **21,892,667.18** | **26,231,866.42** | **17,086,815.43** |






# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018 රු. | 2017 රු. | 2016 රු. |
|---|---:|---:|---:|
| **සටහන - 16 - මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | 207,072.73 | 103,220.70 | 134,538.70 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 17,034.39 | 20,863.90 | 15,157.48 |
| කල්බදු පොලී | - | - | 24,001.85 |
| රුඳවුම් බද්ද | 700.54 | - | 7,287.42 |
| | **224,807.66** | **124,084.60** | **180,985.45** |
| **සටහන - 17 - වෙනත් වියදම්** | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 273,033.00 | 309,998.00 | 214,331.00 |
| ජාලකරණ මෙහෙයුම් | 341,965.00 | 341,955.07 | 341,955.07 |
| සේවක වන්දි | - | - | 350,000.00 |
| වියදම් - රාජගිරිය කාර්යාලය | - | 187,260.18 | 33,208.00 |
| වත්කම් විකිණීමේ ලාභය / අලාභය | - | 61,369.34 | - |
| විවිධ වියදම් | 16,796.00 | 55,265.00 | 322,722.55 |
| නෛතික වියදම් | 1,050,000.00 | 797,130.00 | 730,800.00 |
| අනෙකුත් වියදම් | 9,000.00 | 17,365.00 | 4,149,328.97 |
| | **1,690,794.00** | **1,770,342.59** | **6,142,345.59** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

**සටහන් - 18 දේපළ පිරියත හා උපකරණ**

| | 01.01.2018 දිනට පිරිවැය රු. ශත. | එකතු කිරීම් / මාරු කිරීම් රු. ශත. | ඉවත් කිරීම් / මාරු කිරීම් රු. ශත. | 31.12.2018 දිනට පිරිවැය රු. ශත. |
|---|---|---|---|---|
| **18-A දළ වත්කම්** | | | | |
| ලීබඩු සහ සවිකිරීම් | 3,436,921.48 | - | 13,775.00 | 3,423,146.48 |
| පරිගණක උපාංග | 7,341,901.00 | 539,640.00 | | 7,881,541.00 |
| කාර්යාල උපකරණ | 4,867,329.71 | 241,667.64 | 18,400.00 | 5,090,597.35 |
| මොටර් රථ | 9,080,824.00 | - | - | 9,080,824.00 |
| කැමරා සහ උපකරණ | 14,849,200.00 | 299,000.00 | - | 15,148,200.00 |
| | **39,576,176.19** | **1,080,307.64** | **32,175.00** | **40,624,308.83** |

| | 01.01.2018 දිනට ශේෂය රු. ශත. | වර්ෂය සඳහා ක්ෂය / මාරු කිරීම් රු. ශත. | ඉවත් කිරීම් / ශේෂ ගැලපුම් රු. ශත. | 31.12.2018 දිනට ශේෂය රු. ශත. |
|---|---|---|---|---|
| **18.2 ක්ෂයවීම්** | | | | |
| ලී බඩු සහ සවිකිරීම් | 1,676,678.31 | 250,321.00 | - | 1,926,999.31 |
| පරිගණක උපාංග | 6,090,574.03 | 642,712.00 | 33,853.00 | 6,699,433.03 |
| කාර්යාල උපකරණ | 2,512,411.83 | 382,424.00 | - | 2,894,835.83 |
| මොටර් රථ | 8,946,345.27 | 134,479.00 | - | 9,080,824.27 |
| කැමරා සහ උපකරණ | 9,180,012.80 | 1,138,439.00 | - | 10,318,451.80 |
| | **28,406,022.24** | **2,548,375.00** | **33,853.00** | **30,920,544.24** |
| | **11,170,153.95** | | | **9,703,764.59** |
| **සටහන - 18-A අස්පෘශ්‍ය වත්කම්** | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 2,734,000.00 | 655,000.00 | - | 3,389,000.00 |
| ජාලකරණ මෙහෙයුම් | 3,419,650.72 | - | - | 3,419,650.72 |
| | **6,153,650.72** | **655,000.00** | **-** | **6,808,650.72** |
| **ක්‍රමක්ෂය** | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග | 1,412,091.75 | 273,033.00 | 59,256.00 | 1,625,868.75 |
| ජාලකරණ මෙහෙයුම් | 1,281,181.21 | 341,995.00 | - | 1,623,176.21 |
| | 2,693,272.96 | 615,028.00 | 59,256.00 | 3,249,044.96 |
| | **3,460,377.76** | | | **3,559,605.76** |




# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|---|
| **සටහන - 19 - ස්ථාවර තැම්පතු** | | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593 | | 500,000.00 | 500,000.00 | 500,000.00 |
| ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | | 398,200.00 | 398,200.00 | 398,200.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 83636019 | | 7,000,000.00 | - | - |
| මහජන බැංකුව - ගිණුම් අංකය 2006001000052421 | | 8,000,000.00 | - | - |
| මහජන බැංකුව B-581908 | | 5,000,000.00 | - | - |
| | | **20,898,200.00** | **898,200.00** | **898,200.00** |
| **සටහන - 20 - වෙළඳ හා ලැබිය යුතු දෑ** | | | | |
| වෙළෙඳ ණය ගැතියෝ | **20.1** | 437,737,683.52 | 365,368,348.55 | 190,632,488.52 |
| උත්සව අත්තිකාරම් | | 42,500.00 | 40,000.00 | 271,500.00 |
| සේවක ණය | | 3,170,029.30 | 2,995,587.95 | 2,555,730.00 |
| වැටුප් අත්තිකාරම් | | - | 21,000.00 | 21,000.00 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | | 128,235.71 | 171,625.16 | 224,731.81 |
| සේවකයන්ගෙන් ලැබිය යුතු - වෙනත් | | 100,843.85 | 496,388.20 | - |
| බැංකු ඇපකර | | 3,558,119.35 | 1,179,738.08 | 693,237.91 |
| රඳවා ගැනීමේ බදු | | 2,212.74 | 2,212.74 | - |
| ආර්ථික සේවා ගාස්තු | | 3,599,744.00 | 3,599,744.00 | 3,599,744.00 |
| උපාලි පුවත්පත් සමාගම | | 10,695.00 | 10,695.00 | 10,695.00 |
| ලැබිය යුතු දඩ හා අධිභාරය | | 199,067.50 | 199,067.50 | 148,333.72 |
| අවිනිශ්චිත ගිණුම | | - | 76.63 | - |
| එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | | 2,538,028.86 | 2,538,028.86 | 2,538,028.86 |
| විජය පුවත්පත් සමාගම | | 188,650.74 | 188,650.74 | 188,650.74 |
| ඊවීප | | 3,004.00 | 3,004.00 | 3,004.00 |
| ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | | 63,558.00 | 63,558.00 | 63,558.00 |
| ආපසු ගෙවන තැන්පතු | | 1,137,000.00 | 1,327,000.00 | 1,312,000.00 |
| සෙලින්කෝ රක්ෂණ | | - | 41,800.00 | 41,800.00 |
| ලැබිය යුතු බැංකු පොලී | | 535,380.68 | 59,730.00 | 39,819.68 |
| සේවක මුදල් වංචාව | **20.2** | 11,988,000.00 | 11,988,000.00 | 11,988,000.00 |
| විවිධ ලැබීම් | | 176,563.45 | 1,647.10 | 140,251.50 |
| ඊ-මංසල පාලන ගිණුම | | 367,917.35 | 355,417.35 | 17,502.00 |
| | | **465,547,234.05** | **390,651,319.86** | **214,490,075.74** |
| **සටහන - 20.1 - වෙළෙඳ ණයගැතියෝ** | | | | |
| වෙළෙඳ ණයගැතියෝ | | 451,976,993.49 | 377,742,663.24 | 200,012,425.52 |
| අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම් | | 14,239,309.97 | 12,374,314.69 | 9,379,937.00 |
| | | **437,737,683.52** | **365,368,348.55** | **190,632,488.52** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018 Rs. | 2017 Rs. | 2016 Rs. |
|---|---|---|---|

**සටහන - 20.2 - සේවක මුදල් වංචාව**

ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිලිබඳව පොලිස් මූල්‍ය අපරාධ අංශය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.

**සටහන - 21 - තැන්පතු හා පෙර ගෙවීම්**

| | 2018 Rs. | 2017 Rs. | 2016 Rs. |
|---|---|---|---|
| වාහන සඳහා කලින් ගෙවීම් | - | - | |
| කලින් කල ගෙවීම් | 1,395,510.60 | 1,662,656.66 | 1,944,593.80 |
| | **1,395,510.60** | **1,662,656.66** | **1,944,593.80** |

**සටහන - 22 - මුදල් මුදල් සමාන දෑ**

| | 2018 Rs. | 2017 Rs. | 2016 Rs. |
|---|---|---|---|
| ලංකා බැංකුව ගි.අ. 2323299 | 7,540,695.27 | 29,724,501.94 | 3,251,155.41 |
| ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765 | 315,207.27 | 291,145.04 | 1,662,698.51 |
| මහජන බැංකුව ගි.අ. 200100130005980 | 3,467,878.97 | 791,574.32 | - |
| නිශ්පාදන අත්තිකාරම් | 1,881,603.50 | 424,234.50 | 2,090,853.00 |
| වෙනත් අත්තිකාරම් | 175,000.00 | 185,000.00 | 1,554,710.00 |
| | **13,380,385.01** | **31,416,455.80** | **8,559,416.92** |

**සටහන - 23 - ගෙවිය යුතු පාරිතෝෂික**

| | 2018 Rs. | 2017 Rs. | 2016 Rs. |
|---|---|---|---|
| ඉ / ගෙ ශේෂය | 9,692,481.86 | 8,639,956.56 | 6,930,220.29 |
| පාරිතෝෂක වියදම් වර්ෂය සඳහා | 2,797,621.74 | 1,052,525.30 | 2,534,524.27 |
| | 12,490,103.60 | 9,692,481.86 | 9,464,744.56 |
| පාරිතෝෂක ගෙවීම් | (570,710.00) | - | 824,788.00 |
| **ගෙවිය යුතු පාරිතෝෂක** | **11,919,393.60** | **9,692,481.86** | **8,639,956.56** |





# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

**සටහන - 24 පොලී ගෙවිය යුතු ණය හා ණය ගැනීම්**

| | 2018 වසර 1 ක් තුළ මුදල් ආපසු ගෙවිය යුතු | 2018 වසරකට පසුව ආපසු ගෙවිය යුතු | 2018 මුළු එකතුව |
|---|---|---|---|
| මූල්‍ය බදු | - | - | - |
| | - | - | - |

**සටහන - 24.1 මූල්‍ය බදු**

| | 01.01.2018 දිනට | ලබාගත් නව බදු | ආපසු ගෙවීම් | 31.12.2018 දිනට |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | | | | |
| මිට්සුබිසි වෑන් රථය | - | | - | - |
| | - | - | - | - |
| | - | - | - | - |

**සටහන - 24.2 අනාගත කාලසීමාව සඳහා වෙන්කල මූල්‍ය ගාස්තු**

| | 01.01.2018 දිනට | ලබාගත් නව බදු | ආපසු ගෙවීම් | 31.12.2018 දිනට |
|---|---|---|---|---|
| ලංකා බැංකුව | | | | |
| මිට්සුබිසි වෑන් රථය | - | - | - | - |
| | - | - | - | - |
| | - | | | - |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **සටහන - 25 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ** | | | |
| වෙළෙඳ ණයහිමියෝ | 255,513,856.90 | 239,504,342.38 | 113,449,211.21 |
| දුරකතන ගාස්තු | 47,302.86 | 47,302.86 | 47,302.86 |
| ගෙවිය යුතු අලෙවි කොමිස් | - | 716,321.22 | 110,000.00 |
| උපචිත මුද්දර ගාස්තු | 4,075.00 | 1,375.00 | - |
| උපචිත ගෙවිය යුතු බද්ද | - | 4,830.12 | - |
| එකතුකල අගය මත බද්ද | 49,568,361.22 | 54,853,633.70 | 19,311,617.86 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 21,700,413.36 | 18,466,322.67 | 14,703,471.72 |
| ගෙවිය යුතු ගෙවල් කුළී | 900,000.00 | 900,000.00 | 900,000.00 |
| ආර්ථික සේවා ගාස්තු | - | - | - |
| වෙනත් ණය හිමියෝ | 14,244,094.15 | 1,885,523.10 | 4,061,815.30 |
| විගණන ගාස්තු | 424,000.00 | 174,000.00 | 172,500.00 |
| ඉන්ධන | 41,651.47 | 41,651.47 | 41,651.47 |
| වැටුප් පාලන ගිණුම | 42,938.56 | 11,458.16 | - |
| අවිනිශ්චිත ගිණුම | 10,353.47 | - | - |
| පාලන ගිණුම - Vision 2020 President Secretariat | 616,896.00 | - | - |
| උපචිත වියදම් | 51,372,047.63 | 46,305,017.78 | 26,251,713.08 |
| | **394,485,990.62** | **362,911,778.46** | **179,049,283.50** |






# මූල්‍ය වාර්තා සඳහා සටහන්

**2018 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

**සටහන - 26 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම (LKAS 24)**

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| ප්‍රභාත් සී. පෙරේරා | සභාපති | නැත | අංක. 43/11, බෝධිය පාර, තලාහේන පාර, මාලඹේ. |
| මංජුල හේරත් | සාමාන්‍යාධිකාරී | නැත | අංක. 52, කොම්පෙයාහේන පාර, හෝමාගම. |

2018 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු සිදුනොවීය.

**සටහන - 27 - ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්**

ගොඩනැගිලි අදුත්වැඩියා සඳහා දරන ලද වියදම් තුළ මූලධන ස්වරූපයේ වියදම් ද ඇතුළත් බැවින්, ආයතනය විසින් බදුකරු සමඟ ඇති කරගත් ගිවිසුම වලංගු වසර 5 ක කාලය තුළ ලියා හැරීමට කටයුතු කර ඇත.

**සටහන - 27 - පෙර වර්ෂයේ ගැලපීම්**

| | |
|---|---|
| ක්ෂය නිවැරදි කිරීම | 93,079.00 |
| ණයගැතිශේෂ නිවැරදි කිරීම | (432,408.17) |
| උපචිත වියදම් නිවැරදි කිරීම | 9,547,611.43 |
| ලෙජර් ගිණුම නිවැරදි කිරීම | 89,838.94 |
| ණයහිමියන් නිරවුල් කිරීම | 583,545.18 |
| පාරිතෝෂික වියදම් නිවැරදි කිරීම | (3,753.00) |
| | **9,877,913.38** |

# 2018 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඑස්/ඩී/එස්ටීඅයි/01/2018/09 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 නොවැම්බර් 25 දින

සභාපති

සැලසිනේ රූපවාහිනී ආයතනය

**සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.19,185,720 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. ඉන් තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ඵලදායී ජීවන කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඇස්මේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමටත්, භාවිතා කළ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

නොහැකි වත්කම් සුදුසු පරිදි අපහරණය කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ නිලධාරිනියක විසින් ආයතනයට විරුද්ධව පැවරූ නඩුවක තීන්දුව මත අදාල නිලධාරිනියට රු.992,080 ක් 2019 ජූලි 03 දින ගෙවා තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 06 හි 9 ඡේදය ප්‍රකාරව මෙය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකළ යුතු සිදුවීමක් වුවද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.11,119,014 ක් විය යුතු වුවත්, රු.11,919,393 ක් ලෙස දැක්වීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.800,379 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඈ) දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.8,602,172 ක් සඳහා වත්කම් වෙන් වෙන් වශයෙන් දැක්වෙන විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් එම වත්කම් සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවක් සිදුකළ නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) ජේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති, විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 105 හා 109 | 2017 ඔක්තෝබර් අස්තානගතවී තිබුණු රු.94,900 ක පිරිවැය වූ කැමරාවක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා පත්කළ කමිටුවේ 2017 දෙසැම්බර් 19 දින වාර්තාව අනුව රු.118,625 ක අලාභයක් අයකර ගැනීමට තීරණය කර තිබුණද, 2019 ඔක්තෝබර් 25 දිනවන විටත් එම අලාභ අයකර ගැනීමට හා ඉන්වෙන්ට්‍රි ලේඛනවලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) හා 2015 ජූලි 14 දිනැති හා PFD/RED/01/04/2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අවස්ථා 23 කදී, මාණ්ඩලික නොවන සේවකයින් 8 දෙනෙකුට අත්තිකාරම් ලෙස රු.494,662 ක් ලබාදී තිබුණු අතර අවස්ථා 13 කදී රු.100,000ක උපරිමය ඉක්මවා එකතුව රු.3,374,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 | එකතුව රු.106,735 ක් වූ මාස 6 ඉක්ම වූ චෙක්පත් 9ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සභාපති සඳහා සංග්‍රහ දීමනා, අනෙකුත් සේවකයන් සඳහා සංග්‍රහ දීමනා, අලෙවි දීමනා සහ පැමිණීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,553,256 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 05 දින 05ක ප්‍රමාදයකින් පසුව 2019 අගෝස්තු 05 දින ඉදිරිපත් කර තිබුණි. |
| (ii) 6.5.3 වගන්තිය | 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2019 ඔක්තෝබර් 25 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (iii) 8.2.1 වගන්තිය | එක් එක් වර්ෂයට අදාල ආදායම් අතිරික්තය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.29,704,437 ක් හා ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,210,437 ක් ද විය. |
| (iv) 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව එකතුව රු.මිලියන 20 ක් ස්ථාවර තැන්පතු 3ක ආයෝජනය කර තිබුණි. |
| (v) 8.3.3 වගන්තිය | ප්‍රසාද දීමනා ගෙවීමට සුදුසුකම් ලැබීම සඳහා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන එම වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 140 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස රු.1,293,348 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2015 මැයි 25 දිනැති පීඊඩී 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සන්නිවේදන බිල්පත් සඳහා ගෙවීම් කළ හැකි වුවද, ආයතනය විසින් ස්ථාවර දීමනාවක් වැටුපට එකතුකර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,492,200 ක් ගෙවා තිබුණි. තවද, නිලධාරීන් 03 දෙනෙකු සඳහා චක්‍රලේඛයෙන් අනුමත දීමනාවට |

| | |
|---|---|
| | පටහැනිව රු.88,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර විධායක නොවන කාර්යමණ්ඩලය සඳහා රු.467,999 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම සිදුකළ යුත වුවද ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින මහවැලි අධිකාරියෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය "සැලසිනේ ලිමිටඩ්" ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතනවල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකළ යුතු වුවද ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණය කටයුතුකර නොතිබුණි. වර්ෂ 9 ක කාලයක් ගතවී තිබුණද, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනවලට උප කොන්ත්‍රාත් ලබාදීම ආයතනයේ සාමාන්‍ය ක්‍රමවේදය බවට පත්කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාව අනුව වැඩසටහන් නිෂ්පාදන කාර්යයන් 7 ක් සඳහා රු.37,418,546 ක ආදායමක් ලැබී තිබුණද, එම වැඩසටහන් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.24,285,418 ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි.

(ආ) මුද්‍රණ ආයතනයක් ස්ථාපිත කිරීමේ අරමුණින් වර්ෂයක කාලයකට ගොඩනැඟිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා රු.480,000 ක් 2016 නොවැම්බර් 15 දින බාහිර පාර්ශවයකට ගෙවා තිබුණි. එම ගොඩනැඟිල්ල භාවිතයට සුදුසු තත්ත්වයට සකස්කර නොතිබියදී අදාල මුදල් ගෙවා තිබුණු අතර බද්දකරු සමඟ ගිවිසුමකට ද එළඹ නොතිබුණි. එබැවින් මුද්‍රණ අංශයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගෙන නොතිබුණු අතර ඉන් රු.400,000 ක් නැවත අයකරගැනීමට ද නොහැකි වී තිබුණි.

(ඇ) ආයතනයේ සභාපතිවරයා වෙනුවෙන් කුලී පදනම මත වාහනයක් ලබා ගෙන 2017 ජුලි සිට 2018 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.1,150,000 ක් ගෙවා තිබුණි. අංක 1/2016 හා 2016 මාර්තු 17 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අනුමැතිය ඊට ලබාගෙන නොතිබුණු අතර චක්‍රලේඛයේ 2.3 (I) ඡේදයට පටහැනිව කි.මී. 8,864 ක් ධාවනය කර තිබුණු වාහනයක් ලබා ගෙන තිබුණි. තවද, චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව ආයතනය සහ බද්දකරු අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර සැපයුම්කරු තෝරාගැනීමේදී තරඟකාරී ලංසුකැඳවීමේ ක්‍රමය අනුගමනයකර විධිමත් ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) ආයතනය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව කුලී පදනමට ගොඩනැඟිල්ලක් ලබාගෙන 2016 අගෝස්තු සිට 2017 ජූනි දක්වා මාසයකට රු.120,000 ක් බැගින් රු.1,281,290 ක් කුලී හා රු.720,000 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර මුදල් රෙගුලාසි 835 (2) (ඇ) ප්‍රකාරව මාසික කුලී වටිනාකම තීරණය කිරීම සඳහා රජයේ තක්සේරුකරුගේ සහාය ලබාගෙන නොතිබුණි. තවද, 2016 අගෝස්තු 11 දිනැති අංක 947 දරන ගිවිසුම අනුව එක් පාර්ශවයක් විසින් ගිවිසුම අවලංගු කරන්නේ නම් මාස 3කට පෙර ලිඛිතව අනෙක් පාර්ශවය වෙත දැන්විය යුතු වුවත්, 2017 ජුලි 01 දින සිට ගිවිසුම අවලංගු කරන බව සභාපතිවරයා විසින් ඒක පාර්ශවිකව දන්වා තිබීම හේතුවෙන් රු.640,000 ක් වූ අත්තිකාරම් ආපසු අයකරගත නොහැකි වී තිබුණි.

(ඉ) නෙවිල් ප්‍රනාන්දු පෞද්ගලික රෝහල රජයට පවරා ගැනීමේ උත්සවය සංවිධානය කිරීමේ කටයුතු රු.13,575,000 ක මුදලකට ආයතනය විසින් සිදුකර තිබුණු අතර එහි ප්‍රධාන සංවිධාන කටයුතු ඉටුකර ගැනීම සඳහා රු.4,544,500 ක ඇස්තමේන්තුවකට බාහිර ආයතනයක් තෝරා ගෙන තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. තෝරා ගන්නා ලද සැපයුම්කරු ඉදිරිපත් කළ ඉන්වොයිසියෙහි එකී ආයතනයේ බලයලත් නිලධාරියකු විසින් අත්සන් තබා නොතිබියදී මුදල් ගෙවා තිබුණු අතර එම සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි. මෙම උත්සවයට අදාලව හඳුනාගත් මුළු පිරිවැය රු.5,380,345 ක් වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මිල

ගණන් ඉදිරිපත් කිරීමේදී රු.13,575,000 ක් එනම් පිරිවැයට සියයට 152 ක ලාභයක් එකතු කර මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය හා අතිරේක අංක 28 ප්‍රකාරව රු.500,000 ට වැඩි සේවා ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු පත්කර ප්‍රසම්පාදනයන් සිදුකළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව මුද්‍රණ කාර්යයන් 3ක් ඉටුකර ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් තෝරාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු අතර එකතුව රු.5,041,219ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය රු.51,372,048 ක් වූ අතර එයින් 2015, 2016 හා 2017 වර්ෂයන්හි සිට පැවත එන රු.36,422,506 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ණයගැති ශේෂය රු451,976,993 ක් වූ අතර ඒ තුළ වර්ෂ 3 ඉක්මවූ ණයගැති ශේෂය රු.102,655,375 ක් එනම් මුළු ණයගැති ශේෂයෙන් සියයට 23 ක් විය. මෙම ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණු අතර 2019 ජූලි 31 දින වනවිට එයින් රු.100,024,268 ක් තවදුරටත් අයවීමට පැවතුණි.

(ඇ) තෘතීයික මධ්‍යම කළමනාකරණ මට්ටම යටතේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 05 ක් වුවද, ආයතනය විසින් නිලධාරීන් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 39 දෙනෙකු පමණක් අනුමතකර තිබුණද, කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවකයින් 13 ක් වැඩිපුර බඳවාගෙන තිබුණි. 2015 වර්ෂයේ දී ආයතනය විසින් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර ඊට අදාල සංශෝධන සකස් කර නැවත ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද, එකී සංශෝධනයන් සිදුකර බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමට 2019 ඔක්තෝබර් වනවිටත් කටයුතුකර නොතිබුණි.

(ඈ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DMS/1595 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් අමතන ලද සැලසිනේ ආයතනයේ සේවක මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ ලිපිය අනුව කොන්ත්‍රාත් පදනම මත අලෙවි විධායක තනතුර සඳහා තනතුරු 6 ක් අනුමත කර තිබුණද, මාසික වැටුප තීරණය කිරීම සඳහා තනතුරට අදාල බඳවා ගැනීමේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ තොරතුරු අදාල දෙපාර්තමේන්තුවට ලබාදෙන ලෙස දැනුම් දී තිබුණි. එහෙත් ආයතනය විසින් අදාල

තොරතුරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී වැටුප අනුමත කර ගැනීමකින් තොරව නිලධාරීන් 03දෙනෙකු සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේදී රු.1,489,646 ක වැටුප් ගෙවා තිබුණි.

(ඉ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

SELACINE TELEVISION INSTITUTE
No. 224, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka
Tel. : 011 432 0777 Fax : 011 205 8229
E mail : info@selacine.lk
www.selacine.lk